VERITÉ RESEARCH
Strategic Analysis for Asia

NO.5A, POLICE PARK PLACE, COLOMBO 00500, SRI LANKA
TEL & FAX: + 94 11 2055544
EMAIL: RECEPTION@VERITERESEARCH.ORG

මාධ්‍ය නිවේදනය - 2020 ජූනි 25

**රජයේ අමාත්‍යංශ තීරණය කිරීමට ආදර්ශ ආකෘතියක් වෙරිටේ රිසර්ච් ආයතනය ඉදිරිපත් කරයි**

රජයේ ක්‍රියාකාරීත්වයේ ඵලදායීතාවය සහ කාර්යක්ෂමභාවය පවත්වාගැනීම වෙනුවෙන් කැබිනට් අමාත්‍යවරුන්ට පැවරී තිබෙන්නේ ඉතාම වැදගත් භූමිකාවකි. නමුත්, වෙරිටේ රිසර්ච් ආයතනය සිය විශ්ලේෂණ වලින් පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාවේ කැබිනට් අමාත්‍යංශ නිර්මාණය කෙරෙන්නේ, කාර්යක්ෂමව ක්‍රියාත්මකවීමට රජයට පවතින හැකියාවට බාධා එල්ල වන ආකාරයෙන් බවයි. මේ සම්බන්ධව ජූනි 25වන දින පැවති අන්තර්ජාල සාකච්ඡාවේ දී, පසුගිය කැබිනට් අමාත්‍යංශ සම්බන්ධ ගැටළු තුනක් පිළිබඳව අවධානය යොමු කරන ලදී. මෙම ගැටළු තුන නම්,

**1. තාර්කික පදනමකින් බැහැරව අමාත්‍යංශවලට ඇතුලත් වන විෂයන් තීරණය කිරීම**

**2. අමාත්‍යංශවල සංඛ්‍යාත්මක වර්ධනය සහ**

**3. අමාත්‍යංශ නිරන්තරයෙන් වෙනස් කිරීමයි**

මෙම ගැටළු හේතුවෙන්, රජයේ තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලිය මෙන්ම එසේ ගැනෙන තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ද, ප්‍රමාද වන අතර, එහෙයින් පැවැති රජයන්ගේ වගවීමට පහරක් වන බවද මෙහිදී පෙන්වා දෙන ලදී. එපමණක් නොව, වියදම් ඉහළ යෑමට ද, මෙම ගැටළු හේතු විය.

**වැඩක් කළ හැකි කැබිනට්ටුවක් නිර්මාණය කිරීම**

පසුගිය කැබිනට් අමාත්‍යංශවල තාර්කික පදනම විචාරාත්මක විමසුමකට බඳුන් කල හැකි ක්‍රමවේදයක් වෙරිටේ රිසර්ච් ආයතනය ඉදිරිපත් කළේය. මෙම මෙම ක්‍රමවේදය හරහා කරන ලද විමර්ෂණයෙන් පෙනී යන්නේ, කැබිනට් අමාත්‍යංශ ස්ථාපිත කිරීමේදී තාර්කික පදනමකින් බැහැරවීම, සංඛ්‍යාත්මකව අවශ්‍ය ප්‍රමාණයට වඩා විශාල සංඛ්‍යාවක් ඇති කිරීම සහ අමාත්‍යංශ නිරන්තරයෙන් වෙනස්කම් කිරීම යන ගැටළු 2010 සිට 2020 දක්වා පිහිටුවා තිබෙන කැබිනට් මණ්ඩලවල පොදු ලක්ෂණයක් බවය.

**2014 දෙසැම්බර් මස ජනපති මහින්ද රාජපක්ෂ මහතා පත්කළ කැබිනට් අමාත්‍යංශ** - එකිනෙකට සම්බන්ධයක් නොමැති විෂයන් බද්ධ කරමින් සාදන ලද අමාත්‍යංශ තිබුනේ සියයට 5ක ප්‍රමාණයක වුවත්, සියයට 95ක්ම එකට තිබිය යුතු විෂයන් කඩා වෙන්කරමින් සාදන ලද අමාත්‍යංශ විය.

**2019 නොවැම්බර් මස ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා පත්කළ කැබිනට් අමාත්‍යංශ** - සියයට 58ක් එකිනෙකට සම්බන්ධයක් නොමැති විෂයන් බද්ධ කරමින් සාදන ලද අමාත්‍යංශ විය. සියයට 84ක් එකට තිබිය යුතු විෂයන් කඩා වෙන් කරමින් සාදන ලද අමාත්‍යංශ විය.

**2020 ජනවාරි මස ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතා පත්කළ කැබිනට් අමාත්‍යංශ** - සියයට 17ක අමාත්‍යංශ එකිනෙකට සම්බන්ධයක් නොමැති විෂයන් බද්ධ කරමින් සාදන ලද අමාත්‍යංශ විය. සියයට 79ක් එකට තිබිය යුතු විෂයන් කඩා වෙන් කරමින් සාදන ලද අමාත්‍යංශ විය.

රජය සිය කාර්යභාරරය කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස ඉටු කිරීමට නම්, වඩාත් තාර්කික පදනමක් මත සිට අමාත්‍යංශ තීරණය කිරීම ඉතා වැදගත්ය. මෙම ගැටලුව මග හරවා ගැනීමට උපකාරී වන අමාත්‍යංශ 15කින් සැදුනු ආදර්ශ කැබිනට් අමාත්‍යංශ සාම්පලයක් වෙරිටේ රිසර්ච් ආයතනය මෙහිදී ඉදිරිපත් කළේය.

ආදර්ශ කැබිනට් අමාත්‍යංශ සාම්පලය

1. මුල්‍ය සහ සැළසුම්
2. අධිකරණ
3. ආරක්ෂක
4. අධ්‍යාපන සහ පර්යේෂණ
5. සෞඛ්‍ය
6. කෘෂිකර්මය
7. කම්කරු
8. මහජන සේවා
9. වරාය, නාවික සහ සිවිල් ගුවන්සේවා
10. ආර්ථික කටයුතු
11. ස්වදේශ කටයුතු සහ රාජ්‍ය පරිපාලන
12. විදේශ කටයුතු
13. පවුල් සහ ප්‍රජා සංවර්ධන
14. සමාජ සහ සංස්කෘතික
15. පරිසර

මෙම ආදර්ශ කැබිනට් මණ්ඩලයේ අමාත්‍යංශ යටතට අයත්වන විෂය පථයන් ඇතුළත් ධවල පත්‍රිකාවක් ද, වෙරිටේ රිසර්ච් ආයතනය ප්‍රකාශයට පත්කරනු ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම පාර්ලිමේන්තු නිරීක්ෂක වෙබ් අඩවිය වන Manthri.lk මෙම විශ්ලේෂණයෙන් සොයා ගත් තොරතුරු ප්‍රකාශයට පත්කිරීම වෙනුවෙන් මෙම අන්තර්ජාල සාකච්ඡාව සංවිධානය කළේ ය. එම සාකච්ඡාවේ සංවාද මණ්ඩලය ලෙස, ලංකා වානිජ මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී මංජුල ද සිල්වා, ලර්න්ඒෂියා ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂිකා ආචාර්ය සුජාතා ගමගේ සහ ඇඩ්වොකාටා පර්යේෂණායතනයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී ධනනාත් ප්‍රනාන්දු යන මහත්ම මහත්මීන් සහභාගී විය.